TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

පොදු දේපල් දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබැන්ක් පාර,
කොළඹ 5.
2019.10.24.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>පහසුකම්, ප්‍රදාන ලබා දීමේ වැඩසටහනක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සම්බන්ධවයි.</u>

2019 ඔක්තෝබර් 22 දින ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රස් පක්ෂයේ දිගාමඩුල්ල දිස්ත්‍රික්ක පාර්ලිමේන්තු මන්ත්‍රී එච්.එම්.එම් හරිස් මහතා විසින් කල්මුණේ ප්‍රදේශයේ එමරල්ඩ් ක්‍රීඩා සමාජයේ පරිහරණයට ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කර තිබූ බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ අම්පාර දිස්ත්‍රික් මැතිවරණ නිරීක්ෂක අප වෙත වාර්තා කරන ලදී. මීට අදාළ ඡායාරූප මේ සමඟ අමුණා ඇත.

මෙසේ ක්‍රීඩා උපකරණ ප්‍රදානය කිරීම මගින් එක් විශේෂ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වීමේ හැකියාව ඇති අතර 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 4 (iii) යන නියමයන් ද උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක කවීන් හෙට්ටිආරච්චි මහතා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා හෝ 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී,

Lakwijaya Bandara
.................................

ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක (PPPR)

